ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>ඉන්දියාව කොළඹ පැවති සිව්වන RIMES අමාත්‍ය සමුළුව සඳහා සහභාගී වේ</u>**

ඉන්දියාව 2025 මැයි 7-9 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ පැවති කලාපීය ඒකාබද්ධ බහු-උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියේ (RIMES) සිව්වැනි අමාත්‍ය සමුළුව සඳහා සම සභාපති වශයෙන් සහභාගී විය.

2. RIMES යනු පූර්ව අනතුරු ඇඟවීමේ සේවා, ධාරිතා ගොඩනැගීම සහ ආපද අවදානම් අවම කිරීම සම්බන්ධයෙන් සාමාජික රටවලට සහයෝගය ලබා දෙන අන්තර් රාජ්‍ය ආයතනයකි. ඉන්දියාව දේශගුණික ඔරොත්තු දීම සහ ආපද සූදානම සම්බන්ධයෙන් කලාපීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා සිය නායකත්වය පිළිඹිබු කරමින් RIMES කවුන්සිලයේ වත්මන් සම සභාපති ධූරය හොබවයි.

3. RIMES කවුන්සිල හමුව ඉන්දීය රජයේ භූ විද්‍යා අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එම්. රවිචන්ද්‍රන් මහතාගේ සභාපතිත්වය යටතේ පැවැත්විණ. මෙම කවුන්සිල හමුවේදී ආයතනික ප්‍රමුඛතා පිළිබඳව සාකච්ඡා කළ අතර සමුළුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය ප්‍රකාශයේ කටුම්පත ද අවසන් කරන ලදී.

4. ඊළඟ දිනයේදී අමාත්‍ය සමුළුව පැවති අතර එහිදී ඉන්දීය රජය නියෝජනය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසිනි. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා “Early Warning for All” වැඩසටහන ඇතුළු RIMES මුලපිරීම් සඳහා ඉන්දියාවේ ශක්තිමත් සහයෝගය ඇතුළු RIMES මෙහෙයුම් විමධ්‍යගත කිරීම පිළිබඳව අවධාරණය කළේය. යෝජිත RIMES කලාපීය මධ්‍යස්ථානය සඳහා සත්කාරකත්වය ලබාදීමට ඉන්දියාව කැමති බව ද එතුමා ප්‍රකාශ කළේය.

5. බහු-උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, දේශගුණික සේවා සහ කලාපයේ ආපදවන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සාමූහික කැපවීම අවධාරණය කරමින් RIMES සාමාජික රටවල් විසින් අමාත්‍ය ප්‍රකාශය සම්මත කර ගන්නා ලදී.

***

***කොළඹ***
***2025 මැයි 10***